**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) ඉකුත් වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී රු.46,387 ක් අඩුවෙන් සටහන් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් ශේෂය සහ සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලීය රු.523,780 ක් වුවද රු.578,780 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ පොලී ආදායම රු.55,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අයත් රු.41,851 ක සේවක ඇප තැන්පත් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා එම වටිනාකමින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් ලෙස දක්වා තිබූ උපලේඛණවල එකතුව රු.55,473 ක් වැඩියෙන් දැක්වීම නිසා ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳුනු ගිණුම්**
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා සේවක ණය හා කර්මාන්ත ණය උපලේඛන අනුව ශේෂයන්ගේ රු.5,268,070 ක නොසැසඳීමක් නිරීක්ෂණය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.30,466,605 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂයක් කල්පසු වූ හිඟහිටි වරිපනම් බදු රු.890,892 ක්,වර්ෂ 02 ක් වූ හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.16,244,643 ක්, වර්ෂ 02 ක් කල්පසු වූ හිඟහිටි වෙනත් ආදායම් රු.12,331,070 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,977,984 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ වර්ෂ 03 ක් කල්පසු වූ වියදම් ණයහිමියෝ රු.21,759,556 ක්, වර්ෂ 03 ක් කල්පසු වූ කර්මාන්ත ණයහිමියෝ රු.218,428 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

ඉඩම් ගොඩනැගිලිවල ඔප්පු, පැවරුම් නියෝග, ස්ථාවර වත්කම් ලේඛනවල අයිතිය තහවුරු කිරීමේ සාක්ෂි හා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.8,754,170 ක ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

1.3.5.1 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132(ඔ) වගන්තිය | 49,850 | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් කර තිබුණි. |
| (ආ) | 1978 අංක 48 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ හා 1986 මාර්තු 10 දිනැති ගැසට් පත්‍ර 392/9 නියෝග 67 | | වර්ෂ 2012 සිට 2015 දෙසැම්බර් 31 දක්වා ගොඩනැගිලි අයදුම්පත් 229 ක් අනුමත කර ඇති අතර,අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 30 කට පමණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 218 | | වර්ෂයකට වරක් ඉඩම් හා ගොඩනැඟිලි පරික්ෂා කළයුතු වුවද, අදාළ සමීක්ෂණ කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණි. |
| (ඈ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4:6 වගන්තිය | 276,243 | මියගිය, සේවය අත්හැර ගිය හා සේවය අත්හිටවූ නිලධාරීන් 05 දෙනෙකුගේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂ අය කරගෙන නොතිබුණි. |
| (ඉ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) | මුදල් රෙගුලාසි 189 හා 486 | 15,400 | ඉකුත් වර්ෂයට අදාළ අගරු චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 571 | 138,797 | වර්ෂ 02 ක් කල්පසු වූ තැන්පතු 11 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | | 2009 සැප්තැම්බර් 18 දිනැති PF/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 367,435 | මෝටර් රථ රක්ෂණය කිරීමේදී ඍජුවම ජාතික රක්ෂණ භාර අරමුදල හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් සිදුකළයුතු වුවත්, රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් වාහන රක්ෂණය කර තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,306,215 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,002,361 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 287,200 | 287,200 | 353,523 | 890,892 | 425,200 | 425,200 | 248,506 | 729,945 |
| (ii)බලපත්‍ර ගාස්තු | 290,000 | 290,000 | 450,223 | - | 290,000 | 290,000 | 389,400 | - |
| (iii)වෙනත් ආදායම | 13,999,200 | 13,999,200 | 19,162,117 | 16,266,642 | 14,161,115 | 14,161,115 | 14,151,616 | 9,448,148 |
| එකතුව | 14,576,400 | 14,576,400 | 19,965,863 | 17,157534 | 14,876,315 | 14,876,315 | 14,789,522 | 10,178,093 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 14.6 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 20.0 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 17.1 ක හිඟ ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසදීමේදී හිඟ ආදායම අයකර ගැනීම සියයට 68.5 කින් අඩුවී තිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසාන දිනට උසාවි දඩ වෙනුවෙන් රු.9,619,985 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,669,085 ක් පළාත් සභාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණ කර්තව්‍යයන් සඳහා 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### (ආ) තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ

මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

සෘජු ඉදිකිරීම් යටතේ කර්මාන්ත තුනක් සඳහා ඇස්තමේන්තු අනුව භාණ්ඩ මිළදී නොගැනීම නිසා රු.189,210 ක් වටිනා භාණ්ඩ ඉතිරි වී තිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සභාව තුල සේවකයින් 06 දෙනෙකුගේ අතිරික්තයක් හා සේවකයින් 03 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

3.4 **ප්‍රසම්පාදනය**

---------------

3.4.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.4.2 **සැපයීම් හා සේවා**

------------------

(අ) බණ්ඩාරවෙල ප්‍රාදේශිය සභාව විසින් 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 30 දින දක්වා රු.1,797,994 ක මිලදී ගැනීම් වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය යටතේ සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය

(i) මිල කැඳවීම් ලිපි ලියාපදිංචි තැපැලෙන් යවා නොතිබු අතර, අතින් භාරදීම සිදුකර තිබුණ අතර ඒ සඳහා ද ලේඛනයක් නඩත්තු තර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ආ) (II) ඡේදය ප්‍රකාරව වටිනාකමින් අඩු භාණ්ඩ මිළදී ගැනීම සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 06ක සියයට 54 සිට සියයට 765 දක්වා වූ පරාසයක සහ වියදම් විෂයයන් 05 ක සියයට 31 සිට සියයට 296 දක්වා වු පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර තිබූ අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර පාලනය | | ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් අතර රාජකාරි හා වගකීම් බෙදා වෙන්කර පවරා නොතිබීම. |
| (ආ) | තොග පාලනය | (i) | ගබඩා භාණ්ඩ සම්බන්ධව තොග පොත් නඩත්තු කර නොතිබීම. |
| | | (ii) | ක්ෂණිකව නිවැරදිතාවය පරීක්ෂා කළ හැකි ආකාරයකට භාණ්ඩ ගබඩා කර නොතිබීම. |
| | | (iii) | කර්මාන්ත සඳහා ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීම් හා මිලදී ගැනීම් සඳහා ද්‍රව්‍ය අධියාචනා පත්‍ර හා ලැබීම් නියෝග නිසි පරිදි සටහන් කර නොතිබීම. |
| | | (iv) | විවිධ කර්මාන්ත, සමිතිවලට නිකුත් කර තිබූ භාණ්ඩ ගබඩාවේ රැස්කර තිබීම. |